Good Food, Good Life

Nestlé Lanka PLC News Release

Colombo: 15 March 2016

**’සෑම දිනකම සෞඛ්‍ය සම්පන්න උදෑසන ආහාර වේලක් ළමයින්ට ලබාදිය යුතුමයි’ පණිවිඩය රට වටා රැගෙන යමින් මයිලෝ නවතම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවයි**

මයිලෝ වසර ගණනාවක් පුරා ක්‍රීඩාශීලී උද්යෝගිමත් ළමා පරපුරක් නිර්මාණය කිරීම වෙනුවෙන් කැපවුනු වෙළෙඳනාමයකි. ළමුන්ගේ නීරෝගී ජීවන රටාවට අත්‍යවශ්‍ය සෞඛ්‍ය සම්පන්න උදෑසන ආහාර වේලක ඇති වැදගත්කම පිළිබඳ දැනුවත් කෙරෙන නවතම ව්‍යාපෘතියක් සඳහාද මයිලෝ පසුගියදා තම දායකත්වය ලබා දෙන ලදී.

මෑතකදී සිදුකළ අධ්‍යයනයකින් පෙනී ගොස් තිබෙන්නේ ශ්‍රී ලංකාවේ දරුවන් බොහෝ දෙනෙකු පාසලට යන්නේ උදෑසන ආහාර වේල ගැනීමෙන් තොරව බවයි (මූලාශ්‍ර= Understanding and Mapping Health, Nutrition and Wellness Study – TNS Sri Lanka for Nestlé Lanka, 2012). මෙය ඉතාමත් කණගාටුදායක හෙළිදරව්වක් වන අතර රාත්‍රි ආහාරයෙන් පසු පැය ගණනාවක් නිරාහාරව සිට ලබා ගන්නා පළමු ආහාර වේල උදෑසන ආහාර වේල නිසා එය දවසේ වැදගත්ම ආහාර වේල ලෙස හැඳින්විය හැක. ඉහළ අවධානයක්, චිත්ත ඒකාග්‍රතාවයක් සහ පාසල් අධ්‍යාපන ක්‍රියාකාරකම් කෙරෙහි වැඩි ඉලක්කගතවීමක් පවත්වාගැනීමට උදෑසන ආහාර වේලෙන් ළමුන්ට ලැබෙන්නේ ඉමහත් සහයෝගයකි. සමබර සහ පෝෂණීය උදෑසන ආහාර වේලකින් ක්‍රියාශීලී දිනයක් සඳහා දරුවන්ට අවශ්‍යකරන ප්‍රමාණවත් ජවයක් ලබා දෙයි.

‘‘1960 වර්ෂයේ සිටම මයිලෝ ශ්‍රී ලාංකීය පාරිභෝගික හදවත් දිනාගෙන සිටිනවා. ශ්‍රී ලාංකික දරුවන්ගේ කැමැත්ත වසර 50කට අධික කාලයක සිට ඉහළින්ම දිනාගෙන සිටින මයිලෝ ඔවුන්ගේ දිනය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය නිවැරදි පෝෂණය පිළිබඳව ශ්‍රී ලාංකික පවුල් දැනුවත් කිරීමේ වැදගත්කම අවබෝධ කරගෙන සිටිනවා. එම වගකීමෙහි ප්‍රධාන කොටසක් අප සතු බව අපි කල්පනා කරනවා. ළමුන් තුළ ‘ජයග්‍රහණයේ ජීව ගුණය වර්ධනය’ සඳහා උපකාරීව කටයුතු කරන අපට ඔවුන්ගේ උදෑසන ආහාර වේල ඉතාම වැදගත් වනවා. සමබර ආහාර වේලක් සමග විටමින් සහ ඛණිජ ලවණ කැටිවුන මයිලෝ මෝල්ට්, කිරි සහ කොකෝවා යහගුණය නිසා පරිපූර්ණ ජවයකින් ක්‍රියාශීලී දිනයක් ඇරඹීමට ඔවුන්ට හැකියාව ලැබෙනවා.’’ යනුවෙන් මේ පිළිබඳව අදහස් දැක්වූ නෙස්ලේ ලංකා සමාගමේ පානීය නිපැයුම් අංශයේ නියෝජ්‍ය උප සභාපති නෝමන් කන්නන්ගර මහතා පවසා සිටියේය.

උදෑසන ආහාර වේලෙහි ඇති වැදගත්කම පිළිබඳ දැනුවත් කෙරෙන සුවිශේෂ ව්‍යාපෘතිය මයිලෝ අනුග්‍රහයෙන් කොළඹ ක්‍රීඩා අමාත්‍යාංශ ක්‍රීඩාංගණයේදී ළමුන් 6,000කගේ සහභාගීත්වයෙන් ආරම්භ කරන ලදි. එම අවස්ථාවේදී ළමුන් ඔවුන්ගේ මව්පියන් සමග තම අත ඇති මයිලෝ කෝප්ප ඉහළට ඔසවා සෑම දිනකම සෞඛ්‍ය සම්පන්න උදෑසන ආහාරවේලක් ලබා ගන්නා බවට ප්‍රතිඥාවක් ලබා දුන්හ.

ඉදිරි සති කිහිපය තුළ සෑම මයිලෝ ග්‍රෑම් 400 පැකට්ටුවක් සමගම නොමිලේ ‘බ්‍රෙක්ෆස්ට් මග්’ එකක් ලබා දීමට සැලසුම් කර තිබේ. මයිලෝ පැකට්ටුවක් මිලදී ගැනීමත් සමග උදෑසන ආහාර වේලෙහි ඇති වැදගත්කම පිළිබඳව ඉන් දැනුවත් කිරීමක් සිදුකිරීම එහි අපේක්ෂාවයි. ‘MILO@Breakfast’ තේමාව යටතේ රට පුරා සුපිරි වෙළෙඳසැල්වලදී උදෑසන ආහාර වේලෙහි ඇති වැදගත්කම පිළිබඳව මව්වරුන් සමග මුහුණට මුහුණ දැනුවත් කෙරෙන වැඩසටහන් මෙන්ම ළමුන් සඳහා උදෑසන ආහාර වේල සමග කළ හැකි ක්‍රීඩාවන් ගැන දැනුවත් කිරීමේ වැඩසටහන්ද පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර තිබේ. මෙම මාතෘකාව පිළිබඳව මව්වරුන් දැනුවත් කරමින් මයිලෝ වෑන් රථ රට පුරාම ගමන් කිරීමද මීට සමගාමීව සිදු කෙරේ.

තාක්ෂණය සමග බැඳී සිටින තම පාරිභෝගික පිරිස වෙනුවෙන් මයිලෝ ෆේස්බුක් පිටුව (facebook.com/MILOSrilanka) මගින් මයිලෝ උදෑසන ආහාර වේල් චාරිකාවක් සංවිධානය කිරීමට නියමිතය. මෙය virtual චාරිකාවක් වන අතර ශ්‍රී ලාංකික පවුල්වලට පහසුවෙන් පෝෂණීය උදෑසන ආහාර වේලක් නිර්මාණය කරගැනීමට අදහස් බෙදා ගැනීම මෙහිදී සිදුවේ.

**Visit www.nestle.lk for more information on Nestlé. For media queries, please contact:**

**Damitha Kulatunga**
Corporate Public Affairs Manager
Mob: 0777915949, Off: 2699991 (ext 4540)
damitha.kulatunga@lk.nestle.com

**Samantha Mendis**
Corporate Communications Manager
Mob: 0773405154, Off: 2699991 (ext 4524)
samantha.mendis@lk.nestle.com